ඇමුණුම 7.2.1.2

# කියවීම් පත්‍රිකාව

## ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික ගුහා චිත්‍ර

ශ්‍රී ලංකාවේ ලෙන් චිත්‍ර අතර බහුලව දක්නට ලැබෙන්නේ මිනිසුන් සහ සතුන්ගේ රූප සටහන් ය. එම සත්වයින් අතර අලියා, දිවියා, සිංහයා, කිඹුලා, පත්තෑයා, මුවා, ගෝනා, වඳුරා තලගොයා සහ මොණරා ද වෙති. මේ චිත්‍ර දැකිය හැක්කේ සංකේතාකාරයට ය. දුන්න හා ඊතල දක්නට ඇත්තේ ද සංකේත දෙකක් ලෙස ය. මේ මඟින් ආදි මානවයාගේ ප්‍රධාන ජීවනෝපාය වූ දඩයම සංකේතවත් කර ඇත.

මෙම චිත්‍ර ඇඳීමේ දී සායම් ලී කැබැල්ලකින් හෝ ඇඟිල්ලෙන් තැවරීමේ ශිල්ප ක්‍රම භාවිත කර ඇති බව පෙනේ. අඟුරු, කිරිමැටි, සත්ව ලේ, හිරිගල් වර්ණ වශයෙන් යොදා ගෙන ඇති අතර වර්ණ දියකර ගැනීම සඳහා වතුර හෝ මැලියම් භාවිත කොට ඇත.

## තන්තිරිමලේ ගුහා චිත්‍ර



නිවස තුළ සිටින මිනිස් රූප
(කණ්ඩායම් සම්පිණ්ඩනය)



මිනිස් රූ



තලගොයා